# සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - දකුණු පළාත
# சுகாதார சேவைத் திணைக்களம் - தென் மாகாணம்
# Department of Health Services - Southern Province

අංක 15 ඒ, පහළ ඩික්සන් පාර, ගාල්ල, ශ්‍රී ලංකාව.
15 ஏ,கீழ டிக்ஸன் பாதை, காலி, ஸ்ரீ லங்கா.
No. 15A, Lower Dickson Rd, Galle, Sri Lanka.

E-mail: pdhssp@yahoo.com
Web : www.healthdept.sp.gov.lk
Skype : Pdhs.sp


මගේ අංකය / My No } SPH/EST/EF/02/03-01/2024    ඔබේ අංකය / Your No }    දිනය / Date } 2024.08.07

දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය,
ගාල්ල/මාතර/ හම්බන්තොට.

**<u>අභ්‍යන්තර ස්ථාන මාරු සඳහා අයදුම්පත් කැඳවීම -පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී.</u>**

ඉදිරියේදී නව පත්වීම් මත පැමිණෙන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් අනුප්‍රාප්තිකයන් ලෙස සලකා අභ්‍යන්තර ස්ථාන මාරු ලබා දෙන ලෙස පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් විශාල සංඛ්‍යාවක් මා ගෙන් ඉල්ලීම් සිදු කරමින් පවතී. එබැවින් ඒ සඳහා සියලු පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ට සම අවස්ථාවක් ලබා දීම සඳහා විධිමත් ලෙස ස්ථාන මාරු අයදුම්පත් කැඳවීමට මා විසින් තීරණය කර ඇත. ඒ අනුව එසේ ස්ථාන මාරු අපේක්ෂිත සියලු නිලධාරීන් (මීට පෙර ස්ථාන මාරු අයදුම්පත් ලබාදී තිබුණද) ස්ථාන මාරු අයදුම්පත් නිසි නිල මගින් 2024.08.23 දිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ යොමු කිරීමට කටයුතු කල යුතු අතර ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව සලකා නොලැබීම මත ඇති වන ගැටලු පිළිබඳව මෙම දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

02.ඒ සඳහා පහත නිර්ණායක උපයෝගී කර ගන්නා ලෙසත් දැනුම් දෙමි.

I. නිලධාරීන් වර්තමාන සේවා ස්ථානයේ සේවය කල කාලය මෙහිදී සැලකිල්ලට ගනු නොලැබේ.(2024 වාර්ෂික ස්ථාන මාරු ලද නිලධාරීන් සඳහා හැර)
II. දැනට පුරප්පාඩු හා සේවා අවශ්‍යතාවය පවතින ක්ෂේත්‍ර සඳහා කරනු ලබන ඉල්ලීම් සඳහා ප්‍රමුඛතාවය ලබා දේ.
III. දැඩි සේවා අවශ්‍යතාවය, පවතින මූලික රෝහල් පුරප්පාඩු සඳහා සීමිත සංඛ්‍යාවකට ස්ථාන මාරු ලබා දේ.
IV. ප්‍රසූත සිදු නොවන / සීමිත සංඛ්‍යාවක් සිදුවන ප්‍රාදේශීය රෝහල් සඳහා ඉල්ලුම් කරනු ලබන ස්ථාන මාරු සලකා නොබැලේ.
V. 2022 හා 2024 වාර්ෂික ස්ථාන මාරු මත අනුප්‍රාප්තිකයකු ලබා දිය යුතු ස්ථාන සඳහා කරනු ලබන ඉල්ලීම් පිළිබඳවද සලකා බැලේ.
VI. ඉහත ස්ථාන මාරු ලබා දීම නව පත්වීම් /ස්ථාන මාරු මගින් මෙම පළාතට පැමිණෙන නිලධාරීන් සංඛ්‍යාව මත පදනම්ව හා වාර්ෂික ස්ථාන මාරු සඳහා අනුප්‍රාප්තිකයින් ලබා දීම,අත්‍යවශ්‍ය පුරප්පාඩු ස්ථාන සඳහා අනුයුක්ත කිරීම වැනි කරුණු සඳහා ප්‍රමුඛතාවය හිමිවන බැවින් ස්ථාන මාරු ඉල්ලුම් කරන නිලධාරීන්ට ඉල්ලුම් කරන ස්ථානයන්හි පුරප්පාඩු පැවතියද ස්ථාන මාරු ලබාදීම පිළිබඳව සහතික විය නොහැක.
VII. සීමිත පුරප්පාඩු සඳහා නිලධාරීන් කිහිපදෙනෙකු ඉල්ලුම් කරන අවස්ථාවලදී වර්තමාන සේවා ස්ථානයේ සක්‍රීය සේවයේ නියුක්තව සිටි කාලය අනුව ජ්‍යෙෂ්ඨත්වය සලකා අදාළ ස්ථාන මාරු ලබාදීමට කටයුතු කරනු ලැබේ.
VIII. 2024 වාර්ෂික ස්ථාන මාරු මත ස්ථාන මාරු වී නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කර ඇති නිලධාරීන් (අදාළ ස්ථාන මාරු නිර්දේශවල දන්වා ඇති අවස්ථාවලදී හැර) නව සේවා ස්ථානයේ අවම වශයෙන් මාස 06 ක සක්‍රිය සේවා කාලයක් නොවන්නේ නම් නැවත පූර්ව සේවා ස්ථානය සඳහා ඉල්ලුම් කල නොහැකි අතර වෙනත් සේවා ස්ථාන සඳහා ඉල්ලුම් කිරීමේ හැකියාව පවතී.

03.ඒ අනුව ඉහත නිර්ණායක මත පදනම්ව ස්ථාන මාරු සඳහා ඉල්ලුම් කිරීමට මනාපය පළ කරන නිලධාරීන්ට ඒ සඳහා අයදුම් කරන ලෙසත් ඒ සඳහා මෙම දෙපාර්තමේන්තුවේ www.healthdept.sp.gov.lk වෙබ් අඩවියේ භාගත කිරීම් යටතේ ඇති අභ්‍යන්තර ස්ථාන මාරු අයදුම්පත සම්පූර්ණ කරන ලෙසත් එම අයදුම්පත් නිසි නිල මගින් 2024.08.23 දිනට ප්‍රථම මෙම කාර්යාලය වෙත ලැබෙන ලෙස යොමු කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

04. මේ පිළිබඳව ඔබ යටතේ ඇති අදාළ සියලු නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් තවදුරටත් දන්වමි.

දකුණු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

විශේෂඥ වෛද්‍ය චන්දිම සිරිතුංග
එම්.බී.බී.එස්, එම්.එස්.සී.එම්.ඩී.(ප්‍රජා වෛද්‍ය)
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
දකුණු පළාත

පිටපත් -

01.ලේකම්,ප්‍රධාන අමාත්‍යාංශය,දකුණු පළාත -කා.දැ.ගැ.ස